**දැරණියගල ප්‍රාදේශීය සභාව - 2020**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

දැරණියගල ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට දැරණියගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී .වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දූස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරනලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරනලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයනලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබද වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) පනතේ 6 (i) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව සතු ඉඩම් 04 ක වටිනාකම් හදුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | මේ පිළිබඳව ඉදිරියේදී සොයා බලා කටයුතු කරන බව දන්වා තිබුණි. | දේපල වටිනාකම් හදුනාගෙන ගිණුම්ගත කළ යුතුයි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී ගිවිසුම්ගත නොවූ කර්මාන්ත 19 ක් සඳහා රු. 1,270,000 ක් ණයහිමි ප්‍රතිපාදන සිදුකිරීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් ප්‍රාග්ධන වියදම් හා ණය හිමියන් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී ගිවිසුම් ගත වූ කර්මාන්ත පමණක් ණයහිමි ලෙස පෙන්නුම් කරන බව දන්වා තිබුණි. | ගිවිසුම් ගතවූ කර්මාන්ත සඳහා පමණක් ණයහිමි ප්‍රතිපාදන වෙන්කල යුතුයි. |

**1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 05 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. 214,322,567 ක් හා උප ලේඛන අනුව වටිනාකම රු. 181,054,561 ක් වූයෙන් රු. 33,268,006 ක වෙනසක් විය. | වෙනස්කම් පිළිබඳ ඉදිරියේදී සොයාබලා කටයුතු කරන බව දන්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂයන් ඊට අදාල උපයෝගී ලේඛන සමඟ සැසඳිය යුතුයි. |

## 1.7 අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති,රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම් | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571(2) | 2010 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලයට අදාල කල් ඉකුත් වූ රු.407,095 ක තැන්පතු 03 ක් සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | කල් ඉකුත් වූ තැන්පත් සම්බන්ධයෙන් ඉදිරියේදී කටයුතු කරන බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |
| (ආ) | පළාත් පාලන කොමසාරිස්ගේ අංක 01/2010 දරන චක්‍රලේඛයේ 7.4 (iv) වගන්තිය | සභිකවරුන් 05 දෙනෙකු වෛද්‍ය නොවන හේතූන් මත සභාවට නොපැමිණි අවස්ථා 07 කදී සමාලෝචිත වර්ෂය තුල රු. 110,000 ක සභික දීමනා ගෙවා තිබුණි. | ඉදිරියට මහා සභාවට නොපැමිණෙන මන්ත්‍රීවරුන්ගේ දීමනාව සම්බන්ධව පලාත් පාලන කොමසාරිස්ගේ අංක 01/2010 දරන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කරන බව දන්වා තිබුණි. | චක්‍රලේඛයට පටහැනිව කරන ලද ගෙවීම් අයකර ගත යුතුයි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 7,222,952 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.4,683,358ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් හා බදු | | |
| (i) | හිඟ වරිපනම් බදු ශේෂය රු. 271,326 ක් විය. මෙම ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කොරෝනා වසංගත තත්ත්වය නිසා දේපල තහනම් කිරීමේ කටයුතු සිදුකිරීමට නොහැකි වූ බව දන්වා තිබුණි. | පනත ප්‍රකාරව කටයුතු කර හිඟ වරිපනම් බදු අයකර ගත යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ii) | සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ අක්කර බදු ශේෂය රු. 420,517 ක් පැවතුණි. එම ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම් හිමියන්ගේ තොරතුරු නොමැතිවීම හේතුවෙන් අය කර ගැනීමේ අපහසුවක් පවතින බවත් කොරෝනා වසංගත තත්වය හේතුවෙන් ඉඩම් හිමියන් සොයා යාමට හා ජංගම සේවා පැවැත්වීමට නොහැකි වූ නිසාත් අය කිරීම් අඩු වීමට හේතුවූ බවත් ඉතිරි අක්කර බදු හිඟ ආදායම ජංගම සේවා යොදාගෙන අය කිරීමට කටයුතු කරන බවත් දන්වා තිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කල යුතුයි. |

(ආ) උසාවි දඩ හා මුද්දර ගාස්තු

------------------------------

| | | |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගේ හා අනෙකුත් බලධාරීන්ගෙන් 2020 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු රු. 7,785,507ක ශේෂ පැවතුණි. | ලැබිය යුතු මුද්දර ගාස්තු අය කර ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව දන්වා තිබුණි. | සභාව වෙත අයවිය යුතු ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුයි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

## 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------ | -------------------------- | ------------ |
| (අ) | දැරණියගල නගරය හා ප්‍රාදේශීය සභා සීමාව තුල ජලය බෙදා හැරීම සඳහා සභාව මගින් ලිහිණියාගල හා කහබටේ යන ජල මූලාශ්‍ර භාවිත කර තිබුණද එම ජල මූලාශ්‍ර දෙකෙහි ජලය පිරිපහදු කිරීමක් සිදු නොවන අතර කහබටේ ජල මූලාශ්‍රයෙන් ලබා ගන්නා ජලය ජල ටැංකියක් හරහාද ලිහිණියාගල ජල මූලාශ්‍රයෙන් ලබා ගන්නා ලද ජලය සෘජුවම ඇල මාර්ගයක් හරහාද පාරිභෝගිකයන් වෙත බෙදා හැරීම සිදුකරන බව නිරීක්ෂණය විය. තවද බෙදා හරින ජලය සඳහා ක්ලෝරීන් මිශ්‍ර කරනු ලැබුවද එය ප්‍රමිතිගත තත්ත්වයක් අනුව සිදු නොකරන බවත්, ඒ පිළිබඳ වාර්තා | බෙදාහරිනු ලබන ජලය පරිභෝජනයට සුදුසු බවට පත් කිරීම සඳහා ජාතික ජල සම්පාදන මණ්ඩලය හා දැරණියගල ප්‍රාදේශීය සභාව ඒකාබද්ධව ලිහිණියගල ප්‍රදේශයේ ජල පිරිපහදු පද්ධතියක් ඉදිකිරීමේ කටයුතු මේ වන විට ආරම්භ කර ඇති බව දන්වා තිබුණි. | පාරිභෝගිකයා වෙත නියමිත ප්‍රමිතියට පිරිසිදු කරන ලද ජලය බෙදා හැරීමට කටයුතු කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| | තබා නොගන්නා බවත් නිරීක්ෂණය වූ අතර ජල සාම්පල පරීක්ෂාවේදී එම ජලය පරිභෝජනයට නුසුදුසු බව තහවුරු වී තිබුණද ඒ සඳහා විධිමත් විසඳුම් යෙදීමට නොහැකි වී තිබුණි. තවද සවිකරන ලද ජල මීටර් 1693 කින් 757 ක් ජලයේ පවත්නා මඩ හා අපද්‍රව්‍ය හේතුවෙන් අක්‍රිය වී තිබුණි. | | |
| (ආ) | උඩපොල වතුයායේ පවතින සුසානභූමිය තුල ආදාහනාගාරයක් ඉදි කිරීම සඳහා ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ (460 පරිච්ඡේදය) සවිස්තර ක්‍රියාදාමය යටතේ දෙවන වගන්තියේ නියමයන් 2019 ඔක්තෝබර් 28 දින ලැබී තිබුණද, ඉන්පසු සාමාන්‍ය ක්‍රියාවලිය වෙනුවට 38 (අ) අතුරු විධානය මගින් ඉඩමේ භුක්තිය භාර ගැනීමකින් තොරව ආදාහනාගාරය ඉදි කිරීම වෙනුවෙන් 2019 වර්ෂයේ සිට 2021 පෙබරවාරි මාසය දක්වා රු.22,525,925 ක මුදලක් වැයකර තිබුණි. තවද විගණිත දින වන විටත් ඉඩම් අත්කර ගැනීමේ ක්‍රියාවලියේ 4 වැනි වගන්තිය යටතේ නියමය දක්වා පමණක් කටයුතු සිදුකර තිබුණි. | ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියෙහි 4 වැනි වගන්තියේ නියමය දක්වා මේ වන විට කටයුතු සිදුකර ඇති බවත් ඒ අනුව,මෙම ඉඩම අත්පත් කර ගැනීමේ කටයුතු සිදු වෙමින් පවතින බවත් දන්වා තිබුණි. | ඉදිකිරීම් සිදුකිරීමට පෙර ඉඩම් අත්පත් කර ගැනීමේ පනත ප්‍රකාරව කටයුතු කර අදාල ඉඩමේ භුක්තිය භාර ගත යුතුයි. |

## 3.2 නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 වර්ෂයේ සිට 2020 අගෝස්තු දක්වා කාල පරිච්ඡේදය තුල අක්‍රිය වී ඇති සභාව සතු රු.16,695,000 ක් වටිනාකමැති 2018 ඔක්තෝබර් 30 දින ලැබුණු බැකෝ ලෝඩරය අළුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි. | බැකෝ ලෝඩරය සඳහා මිල ගණන් කැඳවා අදාල අලුත්වැඩියා සිදු කිරීමටත් | නිෂ්ක්‍රීය වත්කම් අලුත්වැඩියා කර ඵලදායී ලෙස උපයෝජනය කළ යුතුයි. |

## 3.3 ව්‍යාපෘති, කර්තව්‍යයන් හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2014 දැයට කිරුළ ජාතික වැඩසටහනට සමගාමීව දැරණියගල බස් නැවතුම්පල කඩ කාමර ඉදි කිරීමේ කොන්ත්‍රාත්තුව රු.44,801,291 ක ඇස්තමේන්තු පිරිවැයක් මත 2013 දෙසැම්බර් 26 දින රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත පිරිනමා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් මෙම ඉදි කිරීම් කටයුතු ආරම්භකර නොතිබීම හේතුවෙන් 2014 අගෝස්තු 12 දින කඩ කාමර 31 ක් බදු දීම සඳහා ටෙන්ඩර් කැඳවා බදු කරුවන් 29 දෙනකුගෙන් ලබා ගන්නා ලද එක්වන් මුදල් (key Money) රු.24,299,000 ක් අදාල කාර්යයට යෙදවීමට නොහැකි වී තිබුණි. | බස් නැවතුම්පල ඉදිකිරීම්කටයුතු කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත ලබා දුන් නමුත් එම කටයුතු නිසි පරිදි සිදු නොවීම නිසා බස් නැවතුම්පල ඉදි කිරීමේ කටයුතු මේ වන විටත් සිදු කිරීමට නොහැකි වී ඇති බව දන්වා තිබුණි. | බදුකරුවන්ගෙන් ලබාගන්නා ලද එක්වන් මුදල් පිළිබඳ තීරණයක් ගත යුතුයි. |
| (ආ) | රථවාහන අංගනයක් ඉදි කිරීමට දැරණියගල, පනාවල විවිධසේවා සමුපකාර සමිතිය සමග රු.1,369,224 ක ඇස්තමේන්තු පිරිවැයක් මත 2019 අගෝස්තු 13 දින ගිවිසුමකට එළඹ තිබුණද අදාල සමිතිය විසින් වැඩ ආරම්භ නොකිරීම හේතුවෙන් සෘජු ශ්‍රම ක්‍රමය යටතේ ඉදි කිරීම් සිදු කිරිමට ගනු ලැබූ තීරණය මත සමාලෝචිත වර්ෂයේදී රු.231,952 ක් වියදම් දරා කොන්ක්‍රීට් කණු පමණක් ඉදිකර තිබීම හේතුවෙන් විගණිත දින වන විටත් සභාව සතු වාහන වර්ෂාවට හා හිරු රශ්මියට නිරාවරණය වී තිබුණු අතර ඒවායේ ආරක්ෂාව සඳහා කඩිනමින් ඉදිකිරීමේ කටයුතු සිදු කිරීමට අවධානය යොමු වී නොතිබුණි. | පැවති කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් ප්‍රාදේශීය සභාවේ ආදායම් තත්වය පහළ මට්ටමක පැවතුන බැවින් එම කටයුතු තාවකාලිකව නවතා තිබුණු නමුත් එම ව්‍යාපෘතිය කඩිනමින් 2021 වසරේදී සිදුකර අවසන් කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | කඩිනමින් ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට කටයුතු කළ යුතුයි. |